ද මැසිනොද් විදුහල කඳන
De Mazenod College - Kandana

නර්තනය

කාලය පැය 2

5 . 04 . 2016

පළමු වාර පරීක්ෂණය 2016

11 ශ්‍රේණිය

Learning Resource Centre
R
De Mazenod College
Kandana

## 1 - කොටස

* නිවැරදි වරණය තෝරන්න.

01, දුටු ගැමුණු රජතුමා 16000 ක් නාලගතන් පිරිවරා රුවන්වැලි සෑයේ ධාතු නිධානෝත්සවයට සහභාගී වූ තොරතුරු දැක්වෙන කෘති දෙකක් වන්නේ,

1. මහා වංශය , චූල වංශය
2. මහා වංශය , බෝධි වංශය
3. මහා වංශය , ථූප වංශය
4. මහා වංශය - දළදා වංශය

02) නැටුම් කරන ගෘහපතියෙකු සහ දුවක් ගැන සඳහන් වන්නේ,

1. සැස්සේරුව , කොරවක්ගල
2. සැස්සේරුව, වෙස්සගිරිය
3. සැස්සේරුව, මුල් කිරිගල
4. සැස්සේරුව , සීගිරිය

03) පොළොන්නරු යුගයේ සහ මහනුවර යුගයේ නර්තන කලාව අනුග්‍රහය දැක්වූ රජවරුන් දෙදෙනෙකි.

1. විමල ධර්ම සූරිය - වීර පරාක්‍රමබාහු නරේන්ද්‍රසිංහ
2. මහා පරාක්‍රම බාහු - නිශ්ශංකමල්ල
3. පණ්ඩිත පරාක්‍රමබාහු - දුටුගැමුණු රජතුමා
4. මහා පරාක්‍රමබාහු - ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ

04) නව ග්‍රහයින් සඳහා කියවෙන ගායනා විශේෂයකි

1. ග්‍රහපත්ති කවි
2. තාලම් කවි
3. කරත්ත කවි
4. නමස්කාර කවි

05) මල බෙර වාදනයේදී සුදු පිරුවටයකින් වසා වාදනය කරන්නේ

1. තාලම් පට හා හොරනෑව
2. තම්මැට්ටම හා දවුල
3. ගැට බෙරය හා දවුල
4. තම්මැට්ටම හා ගැටබෙරය

06) පන්සියක් පමණ හින්දු බාලිකාවන් දෙවිනුවර උපුල්වන් දෙවොලේ නර්තනය කළ බව දැක්වෙන්නේ,

1. රොබට් නොක්ස්ගේ වාර්තාවල
2. හියුංසාංගේ වාර්තාවල
3. ස්පිල්බර්ජන්ගේ වාර්තාවල
4. ඉබන් බතූතාගේ වාර්තාවල

07) තාලයකට නොයෙදෙන ගායනා හඳුන්වන්නේ

1. ආඝාතාත්මක
2. අනුෂ්ටුප්
3. අනාඝාතාත්මක
4. අවනද්ධ

* 8 - 12 ප්‍රශ්න සඳහා දැක්වෙන වගුව ආශ්‍රයෙන් පිළිතුරක් සපයන්න.

| ජේළිය | 1 තීරුව | 2 තීරුව | 3 තීරුව | 4 තීරුව |
|---|---|---|---|---|
| 1 | අඹ විදමන | සේරිමාන | බුධ සිරස | බිසෝකාවි |
| 2 | ඌරායක්කම | පඩුවස්දෙව් | දෙවොල් ගොඩබැසීම | දවුල |
| 3 | ඊගය | පත්තිනි | කුවේණි | සංඛපාල |
| 4 | පොත්කඩේපාලිය | පන්දම | ගැට බෙරය | තම්මැට්ටම |
| 5 | රබාන | වීරමුණ්ඩ | දෙවොල් | අත්මිණිය |

(08) කොහොඹා කංකාරි පුරා වෘත්තයට අදාල චරිත දැක්වෙන්නේ,

1. 2 , 3 ජේලිවල 3 , 4 තීරුවල
2. 2 , 3 ජේලිවල 3 , 2 තීරුවල
3. 3 , 4 ජේලිවල 3 , 4 තීරුවල
4. 2 , 4 ජේලිවල 1 , 3 තීරුවල

09 ශාන්තිකර්මයේ එන නාට්‍යමය අවස්ථා

1. 2 , 4 ජේලිවල 2 , 3 තීරුවල
2. 2 , 3 ජේලිවල 2 , 4 තීරුවල
3. 1 , 2 ජේලිවල 1 , 3 තීරුවල
4. 2 , 4 ජේලිවල 1 , 3 තීරුවල

10) විතත සහ විතතාතත භාණ්ඩ දක්වා ඇත්තේ,

1. 3 , 4 ජේලිවල - 3 තීරුවේ
2. 2 , 3 ජේලිවල 2 තීරුවේ
3. 1 , 2 ජේලිවල - 1 තීරුවේ
4. 2 , 4 ජේලිවල - 4 තීරුවේ

11) පහන් මඩුවේ දී සහ දෙවොල් මඩුවේදී පුදලබන දෙවිවරුන් දැක්වෙන්නේ,

1. 2 , 3 ජේලිවල - 2 , 3 තීරුවල
2. 3 , 5 ජේලිවල - 2 , 3 තීරුවල
3. 1 , 4 ජේලිවල - 1 , 3 තීරුවල
4. 2 , 4 ජේලිවල - 2 , 4 තීරුවල

12) ශාන්තිකර්ම වලදී යොදා ගන්නා රංග භාණ්ඩ දක්වා ඇත්තේ,

1. 2 , 3 , 5 ජේලිවල - 2 , 3 , 4 තීරුවල
2. 2 , 4 , 5 ජේලිවල - 1 , 2 , 3 තීරුවල
3. 3 , 4 , 5 ජේලිවල - 1 , 2 , 4 තීරුවල
4. 1 , 4 , 5 ජේලිවල - 1 , 3 , 4 තීරුවල

13) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කළ ප්‍රථම මුද්‍රා නාට්‍ය ලෙස සලකන්නේ,

1. සිරි සඟබෝ
2. විජය කුවේණි
3. නල දමයන්ති
4. සීතාහරණ

14) කරදිය සහ සැළලිහිණිය යන මුද්‍රා නාට්‍ය නිර්මාණය කළේ,

1. ප්‍රේමකුමාර - වසන්ත කුමාර
2. චිත්‍රසේන - වජිරා
3. චිත්‍රසේන - ප්‍රේම කුමාර
4. පණිභාරත - සරත්චන්ද්‍ර

15 කරදිය මුද්‍රානාට්‍යයේ සංගීතය නිර්මාණය කරන ලද්දේ,

1. ප්‍රේමසිරි කේමදාස, ගුණදාස කපුගේ
2. ඩබ්ලිව්. ඩී. අමරදේව , ලයනල් අල්ගම
3. ප්‍රේමසිරි කේමදාස , වික්ටර් රත්නායක
4. ඩබ්ලිව්. ඩී. අමරදේව , ලයනල් එදිරිසිංහ

16) '' රැඳ ගජිත්තක කට කුන්දන් '' මෙම පදය

1. කස්තිරමක
2. අඩව්වකි
3. වට්ටම් පදයකි
4. සිරුමාරුවකි

17) ගීතයක අරුත නර්තනය මගින් ප්‍රකාශ කිරීමේදී වඩාත් යෝග්‍යවන්නේ,

1. තාලානුකූල චලන
2. අභිචලන
3. රිද්මයානුකූල චලන
4. සංචලන

18) සොකරි සහ කෝලම් රඟ මඩල හැඩයෙන්

1. සිව් රසය
2. ඍජු කෝණාකාරය
3. කවාකාරය
4. ඕවාලාකාරය

19) බිම සකස් කිරීම, පැල නඩත්තුව, ඇස්වනු ගබඩාව, සතුටු වීම යන අංග ගැලපෙන්නේ

1. පතල් කර්මාන්තයටයි
2. ධීවර කර්මාන්තයටයි
3. කෘෂි කර්මාන්තයටයි
4. මැටි කර්මාන්තයටයි

20) ඒකල නර්තනයකදී සහ සමූහ නර්තනයකදී භාවිතා කරනුයේ,

1. පුද්ගල අවකාශය සහ රංග රචනය
2. පොදු අවකාශය සහ දිසා තල
3. පොදු අවකාශය සහ අවකාශ භාවිතය
4. පුද්ගල අවකාශය සහ පොදු අවකාශය

21) මනිපුරි නර්තනයේ දී බහුලව යොදාගන්නා චරිත දෙක වන්නේ,

1. ශිව - පාර්වතී
2. මහාරාස් සහ වසන්තරාස්
3. රාධා - ක්‍රිෂ්ණා
4. රාම - සීතා

22) කථකලි සහ මනිපුරි නර්තන සඳහා යොදාගන්නා ප්‍රධාන අවනද්ධ භාණ්ඩ වන්නේ,

1. ඝබාවාජ් , මෘදගෙම් - කෝල් බෙරය
2. , ප්‍රුංග් බෙරය
3. තබ්ලාව , මද්දල , එඩැක්ක
4. සටම් , පඛාවාජ් , මෘදංගම්

23) කථකලි නර්තනය අනෙකුත් ඉන්දියානු නර්තන ක්‍රමවලට වඩා වෙනස්වන්නේ

1. රංග වින්‍යාසයෙන්
2. තේමා වන්ගේ විවිධත්වයෙන්
3. ගායන සහ වාදනයන්ගෙන්
4. වේෂ නිරූපන ක්‍රමයෙන්

24) මනිපුරි නර්තන ශිල්පිනියකගේ රංග වස්ත්‍රාභරණ වලට අයත් වන්නේ,

1. ජිමික්කි, මාට්ටල්, ඔට්ටියානම්
2. රිෂම්පුරිට්, කුම්මි , චූරා
3. පච්චා, කත්ති, තාඩි
4. චෝලි, දෘපට්ටා, ලෙහෙනා

25) මනිපුරි නර්තනය සහ කථකලි නර්තනයෙහි ප්‍රවර්ධනය සඳහා අනුග්‍රහය දැක්වූ කවියන් දෙදෙනෙක් වන්නේ,

1. කොට්ඨාරක්කාර , කාලිදාස
2. කැලි කට්හි සැමොරින් , වක්කියර්
3. රවීන්ද්‍රනාත් තාගෝර් , වල්ලි තෝල් නාරායන මෙනන්
4. රාජා කර්තා - තාම්පුරම් රජු

## 2 - කොටස (උඩරට නර්තනය).

26) කොහොඹා කංකාරි ශාන්තිකර්මය පවත්වන ලද්දේ,

1. විශාලා මහනුවර තුන් බිය දුරුකිරීමට
2. සේරිමාන රජුගේ හිස රුදාව දුරු කිරීමට
3. පඬුවස් දෙව් රජුගේ දිවිදොස් දුරු කිරීමට
4. මැණික්පාල බිසවගේ ඒන දොස හැරීමට

27) කොහොඹා කංකාරියට අයත් ශාස්ත්‍රීය නර්තනය ලෙස සලකනු ලබන්නේ,

1. උඟුරයක්කම සහ ගුරුගෙ මාලාව
2. ගුරුකොට මාලාව සහ වැදියක්කම
3. ආවැන්දුම සහ අස්නේ
4. අස්නෙ සහ නයා යක්කම

28) කොහොඹා කංකාරියේ දී පුද ලබන්නේ,

1. කොහොඹා දෙවිවරු සහ බණ්ඩාර දෙවිවරු
2. වීරමුණ්ඩ සහ මලය රජු
3. කොහොඹා තුන්කට්ටුව, රාහු අසුරේන්ද්‍රයා
4. ඉරුගල් බණ්ඩාර සහ සක්‍ර දේවේන්ද්‍රයා

29) "දොං ජිංත ගත දොංත" බෙර පදය අයත් වන්නේ,

1. මාත්‍රා 2 + 2 + 4 තාල රූපයට
2. මාත්‍රා 3 + 4 තාල රූපයට
3. මාත්‍රා 2 + 4 තාල රූපයට
4. මාත්‍රා 2 + 3 තාල රූපයට

30) උඩරට නර්තන කලාවේ පුරෝගාමී චරිත කිහිපයක් වන්නේ,

1. අල්ගම කිරි ගනිත, විල්සන් ඔල බොඩුව, චිත්‍රසේන
2. ඇස්. පණිභාරත, අල්ගම කිරිගනිත, කේ. ඇස්. ප්‍රනාන්දු
3. ඇස්. පණිභාරත, අරනෝලිස් ඉඹුල්ගොඩ, නිත්තවෙල
4. චිත්‍රසේන , ප්‍රේම කුමාර එපිටවෙල, සන්දෝරිස්

31) සැවුලා වන්නමට අදාල බෙරපදය වන්නේ,

1. ජිං ජිමිකිට තත් කිටිතක
2. දොං දොං ජිං ජිං ගජිගත
3. ජිංගත ගොගො
4. දොං ජිංත ගක දොංත

32) තත් ජිත් තක ජිත් තත් ජිත් ගොං තරිකු තා යනු

1. දොං ජිංත ගත දොංත වට්ටමට අදාල කස්තිරමකි
2. දොං ජිංත ගත දොංත වට්ටමට අදාල අඩව්වකි
3. තුදාංගත දෙකී වට්ටමට අයත් අඩව්වකි
4. වට්ටමට අයත් කස්තිරමකි

33) ගැටබෙරය සෑදීමට යොදාගන්නා අමු ද්‍රව්‍ය වන්නේ

1. සම් සහ දැව
2. හරක්සම්, එළු සම්, රත් ඇහැල
3. කොස්, රත් ඇහැල, ගං සූරිය
4. හරක් සම්, එළු සම්, වඳුරු සම්

34) උඩරට සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම වන්නේ

1. කොහොඹා කංකාරිය, රිද්දියාගය,
2. කොහොඹා කංකාරි, බලියකුම,
3. කොහොඹා කංකාරි, බලියාගය,
4. කොහොඹා කංකාරි, කිරි මඩුව

5.04.2016

Learning Resource Center
College

35) සොකරි නාටකයෙහි එන චරිත කිහිපයකි.

1. සොකරි, පරයා, ජසයා, වෙදරාල
2. ගුරුහාමි, වෙදරාල, සොකරි, පරයා
3. සොකරි, ආඩිගුරු, වෙදරාල, මුදලි
4. වෙදරාල, සොකරි, ආඩිගුරු, තෝංචා

36) උඩරට වෙස් ඇඳුම් කට්ටලයට පමණක් යොදාගනු ලබන රංග වස්ත්‍රාභරණ වන්නේ,

1. ජායිම්පත, අවුල් හැරය,
2. ජටාව, පාහින්පහත, සේලය
3. නෙත්තිමාලය, බන්දි වළලු, කම්පටි
4. අවුල් හැරය, තෝඩුපත්, ඉනහැඩය

37) උඩරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ හැඳින්වීමට වඩාත් යෝග්‍ය වන්නේ,

1. උඩුනුවර, යටිනුවර, දුම්බර, හේවාහැට
2. හත්කෝරලය, සතර කෝරලය, නුවර
3. මහනුවර, කෑගල්ල, කුරුණෑගල
4. අල්ගම, තිත්තපජ්ජල, තිත්තවෙල

38) උඩරට නර්තනය සඳහා පමණක් යොදාගනු ලබන පාරිභාෂිත වචන වන්නේ,

1. කස්තිරම, සීරුමාරුව, අඩව්ව
2. ගොඩ සරඹ, සීරු මාරුව, කස්තිරම
3. සේලය, අවුල් හැරය, බුබුළු පටිය
4. තිත් මාත්‍රා, ඕඩිය, ඉනහැරය

39) පන් තේරු නැටුම් අන්තර්ගත බෞද්ධාගමික පුද පූජා අවස්ථාවක් වන්නේ,

1. පෝය හේවිසි , පන්සාලිස් වස
2. පෙරහැර, පෝය හේවිසි
3. කඨින පූජා , පෙර හැර
4. සත් සති සවිසි විවරණ

40) "සුරිඳුන් පෙර සිටන් - බලයුත් සැව තිඳුන්" යන වන්නම් ගායනයට අදාල ඉතිරි පද කොටස වන්නේ,

1. දැරූ පා අතලුයෙන් ජය ගෙන කඳ කුමරුන්
2. ඇසුරන් කළ යුදෙන් ජය ගෙන කඳ කුමරුන්
3. ...... ගොස් කළ යුදෙන් අසුරන් ජය නොලදින්
4. සැවුලා නම එයින් පල කළ උපතින්

p.T.O

5.04.2016

ද මැසිනොද් විදුහල - කඳාන

De Mazenod College - Kandana

# නර්තනය

පැය 2

පළමු වාර පරීක්ෂණය 2016 | 11 ශ්‍රේණිය

Learning Resource Center
De Mazenod College
Kandana

II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ තවත් ප්‍රශ්න 4 ක් තෝරා පිළිතුරු ලියන්න
- සියලුම ප්‍රශ්න 5 කි

1)

1. තුන්තිතේ ප්‍රභේදයක් නම් කරන්න
2. එම තිතට අදාලව කස්තිරමක් හා අඩව්වක් ප්‍රස්තාර කරන්න
3. දොම් පිතෙ ගත දොම්ත වට්ටමේ කස්තිරම අදාල තාල රූපය අනුව ප්‍රස්තාර කර අඩව්වක් ලියා දක්වන්න

2)

1. කෝලම් නාටකයට ප්‍රචලිත ප්‍රදේශ 2 ක් ලියන්න
2. කෝලම් චරිත 4 ක් සහ එහි ඇති නැටුම් වර්ග 2 ක් ලියා දක්වන්න
3. ඔබ දන්නා ගැමි නාටක සම්ප්‍රදායන් පිළිබඳව හැඳින්වීමක් කරන්න

3)

1. මුසලඩි වන්නමේ තාල රූප ලියා දක්වන්න
2. එහි කවියක් ලියන්න
3. එම වන්නම සඳහා යොදා ගත හැකි අඩව්වක් ලියන්න

4) මින් 3 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න

1. ගැමි නැටුම්
2. ගොඩ සරඹ
3. වෙස් මුහුණු
4. තාලය

5)



A



B

1. මෙහි A හා B රූප වලින් දැක්වෙන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න
2. එහි A රූපයේ නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය හා එම රූපයේ ඇති චරිත නම් කරන්න
3. B නර්තන සම්ප්‍රදාය පිළිබඳ හැඳින්වීමක් කරන්න

6)

1. හටන් කවියක් ලියන්න
2. මෝල් ගස් කවියක් ලියන්න
3. ඔබ ඉගෙන ගෙන ඇති මාත්‍රා 2/3 තාලයට අයත් වන්නමක එක් කවියක් ලියා දක්වන්න